Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

# බුද්ධ ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ දැනුම් දීම සඳහා ආනන්ද තෙරුන් වහන්සේ මගින් බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා වහන්සේලා රැස් කරවන ලද්දේ,

(1) සැවැත් නුවර ජේතවනාරාමයට ය. (2) විශාලා මහනුවර චාපාල චෛතියට ය.
(3) විශාලා මහනුවර කූටාගාර ශාලාවට ය. (4) බේලුව නම් ගමට ය.

02 ආගන්තුක සංග්‍රහයක් වුවද පිළිගැන්වීමට සුදුසු බැවින් මහා සංඝරත්නය,

(1) ආහුනෙය්‍ය නම් වේ. (2) පාහුනෙය්‍ය නම් වේ.
(3) දක්ඛිනෙය්‍ය නම් වේ. (4) අඤ්ජලිකරණීය වේ.

03 බුදුරජාණන් වහන්සේ තෙවැනි වර ලංකාවට වැඩම කළ ස්ථානය වන්නේ,

(1) මහියංගණයට ය. (2) මුතියංගණයට ය.
(3) කැලණියට ය. (4) නාගදීපයට ය.

04 බුදුරජාණන් වහන්සේ යශෝධරා දේවිය අරබයා දේශනා කළ ජාතක කතාව වන්නේ,

(1) කුස ජාතකයයි. (2) චන්ද කින්නර ජාතකයයි.
(3) වෙස්සන්තර ජාතකයයි. (4) අපණ්ණක ජාතකයයි.

05 ''බෞද්ධයාගේ අත්පොත'' නමින් හඳුන්වන්නේ,

(1) ධම්ම පදය ය. (2) සුභාෂිතය ය.
(3) ලෝවැඩ සඟරාව ය. (4) ජාතක පොත් වහන්සේ ය.

06 මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු,

(1) සිව්සස් ය. (2) සිව් බඹ විහරණ ය.
(3) සතර සම්‍යක්ප්‍රදාන ය. (4) සතර සංග්‍රහ වස්තු ය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.07 හිරි ඔත්තප්ප යන ධර්ම කරුණට නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1) සීලයේ පදනමයි. (2) දේව ධර්මයයි.

(3) ලෝක පාලක ධර්මයයි. (4) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයයි.

08 අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් ඉටුකළ යුතු ආකාරය විස්තර කෙරෙන සූත්‍ර දේශනාව නම්,

(1) සිඟාලෝවාද සූත්‍රය (2) මහා මංගල සූත්‍රය

(3) කරණීය මෙත්ත සූත්‍රය (4) පරාභව සූත්‍රය

09 දුකට හේතුව,

(1) සැපතයි. (2) තෘෂ්ණාවයි. (3) ශෝකයයි. (4) මෝහයයි.

10 සොරුන්ගේ පහර කෑමකට ලක්ව පිරිනිවන් පෑමට පත්වූ මහ රහතන් වහන්සේ

(1) සැරියුත් මහ රහතන් වහන්සේ (2) මුගලන් මහ රහතන් වහන්සේ

(3) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ (4) අංගුලිමාල මහ රහතන් වහන්සේ

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(චේතනාව / තිදොර / සම්මා ආජීව / අත්තකිලමථානුයෝගය / පරම සුවය)

11 දිවි පැවැත්ම සඳහා යහපත් වෘත්තීන් හි නියැලීම හඳුන්වන්නේ .................................................... යනුවෙනි.

12 බුදු දහමට අනුව මිනිසාට ඇති ........................................................................................... නිර්වාණයයි.

13 සිරුරට අපමණ දුක් දෙමින් විමුක්තිය සෙවීමේ අන්තවාදී පිළිවෙත .......................................................... යි.

14 කුසල, අකුසල සියලු ක්‍රියා සඳහා මුල් වන්නේ ..............................................................................................

15 කර්මයට මුල් වන්නේ .................................................................................................................... යි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

16 අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම මංගල කරුණක් බව මහා මංගල සූත්‍රයේ දක්වා තිබේ. ( )

17 වැවයි, දාගැබයි, ගමයි සංකල්පය ශ්‍රී ලාංකිකයන්ටම ආවේණික වූ අගනා සංකල්පයකි. ( )

18 රාග, ද්වේශ, මෝහ යන සියලු කෙලෙස් දුරු කිරීම භව තණ්හාව ලෙස හැඳින්වේ. ( )

19 මෛත්‍රී සහගතව කථා කිරීම පැවිදි උතුමන් විසින් ගිහියන්ට කළ යුතු යුතුකමකි. ( )

20 ''ලෝවැඩ සඟරාව'' වීදාගම මහ මෛත්‍රිය හිමියන්ගේ කෘතියකි. ( )

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේට වැළඳුණු මාරාන්තික රෝගය කුමක් ද?

(ii) බුදුරජාණන් වහන්සේ ජීවමාන ව සිටිය දී පැවිදිව රහත් වූ අන්තිම ශ්‍රාවකයා නම් කරන්න.

(iii) සංඝරත්නයේ ගුණ 4 ක් ලියන්න.

(iv) බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමෙන් බෞද්ධයාට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

(v) භාවනාව අර්ථ දක්වන්න.

(vi) යසෝදරා චරිතයෙන් ගත හැකි ආදර්ශ 4 ක් ලියන්න.

(vii) ධම්ම පදයේ ඇති ගාථා ගණන හා වග්ග ගණන සඳහන් කරන්න.

(viii) ''චතු අප්පමඤ්ඤා'' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ix) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය නම් කරන්න.

(x) බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහානාහිමියන් ලද තනතුරු 2 ක් ලියන්න. (ලකුණු $2 \times 10 = 20$)

02 (i) සිව් බඹ විහරණ නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත කරුණුවලින් 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) මෙම ගුණාංග ප්‍රගුණ කිරීමෙන් ඔබට සැලසෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න. (ලකුණු 05)

03 (i) ශීලය අර්ථ දක්වන්න. (ලකුණු 02)

(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් මාර්ග අංග නම් කරන්න. (ලකුණු 03)

(iii) සිල්වත්වීමේ ප්‍රයෝජන කිහිපයක් විස්තර කරන්න. (ලකුණු 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04 (i) අටලෝ දහම නම් කරන්න. (ලකුණු 02)

(ii) බුදුරජාණන්වහන්සේ අටලෝ දහමින් කම්පා නොවූ අවස්ථා 2 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) අටලෝ දහම වටහාගෙන කටයුතු කිරීමෙන් සැලසෙන යහපත විස්තර කරන්න. (ලකුණු 05)

05 (i) ත්‍රි ශික්ෂාව නම් කරන්න. (ලකුණු 02)

(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්‍ෂාවට අනුව බෙදා දක්වන්න. (ලකුණු 04)

(iii) එක් මාර්ගාංගයක් විස්තර කරන්න. (ලකුණු 04)

06 (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන පාඨයේ අර්ථය ලියන්න. (ලකුණු 02)

(ii) පුබ්බේ කත හේතුවාදය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) කුසල අකුසල කර්ම මැන බැලිය හැකි ප්‍රධාන නිර්ණායක පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 04)

07 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) භද්දකච්චායනා තෙරණිය හෝ බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමි

(ii) වැවයි, දාගැබයි, ගමයි පන්සලයි

(iii) සේව්‍ය හා සේවක යුතුකම් ඉටුකොට දියුණුව සලසා ගනිමු.

(iv) ධම්ම පදය (ලකුණු 5 x 2 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 3 (02) 2 (03) 3 (04) 2 (05) 1 (06) 2 (07) 4 (08) 1

(09) 2 (10) 2 (11) සම්මා ආජීව (12) පරම සුවය (13) අත්තකිලමථානුයෝගය

(14) තිදොර (15) චේතනාය (16) ✓ (17) ✓ (18) × (19) × (20) ✓

## II කොටස

01 (i) ලෝහිත පක්ඛන්දිකා රෝගය / ලේ අතීසාරය

(ii) සුභද්‍ර භික්ෂූන් වහන්සේ

(iii) සුපටිපන්න / උජුපටිපන්න / ඤායපටිපන්න / සාමීචිපටිපන්න / ආහුනෙය්‍ය / පාහුනෙය්‍ය / දක්ඛිනෙය්‍ය / අඤ්ජලිකරණීය

(iv) සහයෝගය, සාමූහිකත්වය වර්ධනය වීම / පංචසීලය ආරක්ෂා වීම / මෙලොව, පරලොව සුගතියට මග සැළසීම / කණ්ඩායම් කුසලතා වැඩි දියුණු විම / ශ්‍රද්ධාව වර්ධනය වීම / නුදුටු දේවල් දැක ගැනීම / සිත පහදවා ගැනීමට හැකිවීම / අකුසල් සිතිවිලි යටපත් වීම / කුසල් සිත් වැඩීම ආදී....

(v) කුසල් සිත් වැඩෙන මානසික අභ්‍යාසය භාවනා නම් වේ / සිත එකඟ කර ගත හැකි ක්‍රමවේදය භාවනාවයි.

(vi) අධිෂ්ඨාන පූර්වකව කටයුතු කිරීම / ගුණ ගරුක වීමෙන් ප්‍රශංසාවට ලක්විම / අනතිමානී වීම / නිසි අවස්ථාවේ දී නිසි ලෙස කටයුතු කිරීම / පති භක්තිය / කැපවීම ආදී......

(vii) ගාථා - 423 වග්ග - 26

(viii) සතර බ්‍රහ්ම විහරණ / සිව් බඹ විහරණ

(ix) තමා පවින් වැලකීම / අන් අය පවින් වැළැක්වීම, නොකරවීම / අන් අයගේ පව්කම්වලට අනුබල නොදීම

(x) සාහිත්‍ය සූරී / අග්ගමහා පණ්ඩිත / සාහිත්‍ය චක්‍රවර්ති / අභිධජ මහා රට්ඨගුරු / මහනායක පදවිය

(ලකුණු 2 x 10 = 20)

02 (i) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා (ලකුණු 02)

(ii) මෙත්තා - මිතුරු බව
කරුණා - අන් අයගේ විපතකදී ඇතිවන අනුකම්පාව
මුදිතා - අන් අයගේ දියුණුව දැක සතුටු වීම
උපේක්ඛා - සැප, දුක් අවස්ථාවලදී මධ්‍යස්ථව සිතීම/සිතේ සමබර බව (ලකුණු 03)

(iii) පෙළ පොත 8 පාඩම - සමස්තය සලකා ලකුණු ලබාදෙන්න. (ලකුණු 05)

03 (i) සීලය යනු කායික හා වාචසික ශික්ෂණයයි. / කය හා වචනය සංවර කර ගැනීම ශීලයයි. (ලකුණු 02)

(ii) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව (ලකුණු 03)

(iii) පෙළ පොත 9 පාඩම - සමස්තය සළකා ලකුණු ලබාදෙන්න. (ලකුණු 02)

04 (i) ලාභ - අලාභ / යස - අයස / නින්දා - ප්‍රශංසා / දුක - සැප (ලකුණු 02)

(ii) වේරංජාවේ වස් විසීම (12 වන වස් කාලය) / සුන්දරී පරිබ්‍රාජිකාව, මාගන්දියා වැනි අයගේ අපහාස ඉවසීම / දෙව්දත් තෙරුන්ගේ ගල් පෙරලීම නිසා පාදයේ සුළැඟිල්ලේ වූ තුවාලය මෙත් සිතින් දරා ගැනීම / විවිධ අන්‍ය තීර්ථකයන්ගේ අපවාදවලට මුහුණ දීම ආදී...... (ලකුණු 03)

(iii) පෙළ පොත 12 පාඩම - සමස්තය සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

05 (i) සීල, සමාධි, ප්‍රඥා (ලකුණු 02)

(ii) ප්‍රඥා / පඤ්ඤා - සම්මා දිට්ඨි / සම්මා සංකප්ප
සීල - සම්මා වාචා / සම්මා කම්මන්ත / සම්මා ආජීව
සමාධි - සම්මා වායාම / සම්මා සති / සම්මා සමාධි

(iii) පෙළ පොත 15 පාඩම - සමස්තය සලකා බලා ලකුණු දෙන්න. (ලකුණු 04)

06 (i) ''මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි.'' (ලකුණු 02)

(ii) පුබ්බේකත හේතුවාදය ජෛන මහා වීරගේ ඉගැන්වීමකි. / සියල්ල පෙර කර්මයෙන් සිදුවේ යැයි මින් පිළිගැනේ / කය ප්‍රධාන කොට යමක් සිදුවන බවද මනස දෙවනු වන බවද පිළිගැනේ (ලකුණු 04)

(iii) චේතනාව හා විපාකය ප්‍රධාන මිණුම් දඬු වේ. (පෙළ පොත 16 පාඩම - සමස්තය සලකා පිළිතුරට ලකුණු දෙන්න.) (ලකුණු 04)

07 (i) පෙළ පොත 06 පාඩම (11 පිටුව බලන්න. (ii) පෙළ පොත 13 පාඩම බලන්න.

(iii) පෙළ පොත 10 පාඩම බලන්න. (iv) පෙළ පොත 07 පාඩම බලන්න.

(ලකුණු 5 x 2 = 10)